# ආඩම්බර හා පැංචා



කථාව : ආර්.එම්.සසිනි සෙයන්සා රත්නායක.

# හැඳින්වීම

කෘතියේ නම: ආඩම්බර හා පැංචා

කතෘගේ නම: ආර්.එම්.සසිනි සෙයන්සා රත්නායක.

කතෘ අයිතිය : (කථාව සහ සිතුවම්)

ආර්.එම්.සසිනි සෙයන්සා රත්නායක.

කතෘගේ වෙනත් කෘති : පුංචි රුවනි,අවුරුදු කුමාරයා

, අපූරු යාළුවෝ

කෘතිය පළ කල දිනය : 2025.02.08

**ISBN අංකය: 978-624-208-414-5**

# පිදුම

මෙම කථාපොත ලිවීමට මා හට උපකාර කල මාගේ

අම්මාටත් පවුලේ සියළු දෙනා හා මාගේ ගුරු

මව්වරුන්ටත්  ආදරයෙන් මෙම පොත පුදකර සිටිමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# ස්තුතිය.

මාහට අකුරු කියාදුන් මාගේ ආදරණීය ගුරුතුමියන් වන රේනුකා ගුරුතුමියටත් මදාරා ගුරු හා මෙම අවස්ථාව මා හට ලබාදුන් මාගේ පාසලේ විදුහල්පතිතුමියට මාගේ ප්‍රණාමය පුදකර සිටිමි.

එකමත් එක කැලෑවක හා පවුලක් හිටියා.මේ ගෙදර චූටි

හා පැංචෙක් හිටියා.හා පැංචා හරිම ලස්සනයි.

එයාට දිග ලස්සන කන් දෙකක් තිබුණා. පුළුන් බෝලයක්

වගේ හිටපු මේ පැංචා කන් දෙක නිසා හරිම ආඩම්බරෙන්

තමයි හිටියේ.



පැංචා කැලෑවේ යන කොට සද්දයක් ඇහුනම නැවතිලා ඒ පැත්තට කන් දෙක හරවනවා.කටකාර පැංචා අනිත් අය කියන දේ ඇහුවේ නෑ.



අම්මයි තාත්තයි පැංචට නිතරම අවවාද කලා. හොද හා පැටියෙක් වෙන්න කියලා.ඒත් මේ පැංචා අම්මයි තාත්තයි කියපු කිසි දෙයක් ඇහුවෙ නෑ..



දවසක් උදේම පැංචා කැලේ පැත්තට ගියා.එයා දැක්කා ලස්සන විලක්.ඉබි පැංචෙක් විලේ  පීන පීන හිටියා.



පැංචා ඉබ්බා ලඟට කිට්ටු වුණා."ආ... යාළුවේ මොකද තනියම ''පැංචා ඇහුවා.ඉබි පැංචට කියපු දේ ඇහුනෙ නෑ. ඉබි පැංචා හා පැංචා ලඟට කිට්ටු උනා."ඔයා මටද කථා කලේ'' ඉබි පැංචා ඇහුවා.



“ඔයාගේ  චූටිම චූටි කන් දෙක ඇහෙන්නෙ නෑ නේද?’’ හා පැංචා හිනා වෙලා කිවුවා.“මට වගේ දිග ලස්සන කන් දෙකක් ඔයාට නෑ. ඔයාගේ කන් ඇහෙනව මදි. චූටි කන් දෙකක් නේ....’’



මේ කතාවට ඉබි පැංචාට හොඳටම දුක හිතුනා.“ලස්සන දිග කන් දෙකක් තිබුනයි කියල අනික් අයට හිනා වෙන්න එපා යාලුවේ. මගේ කන් දෙක මට හොදයි’’ ඉබි පැංචා කිවුවා.හා පැංචා මහා හයියෙන් ඉබි පැංචට හිනා වුනා.



ඔන්න ආයෙමත් දවසක් මේ දෙන්නා හම්බ වුනා.එදා නම් දෙන්නා සෙල්ලම් කරා. ඒ වෙලාවේ එතනින් ලොකු උකුස්සෙක් පියාඹලා ගියා.උකුස්සා මේ දෙන්නා දිහා හොඳට බැලුවා.



ඈත ගහක් උඩට ගියපු මේ උකුස්සා දිහා ඉබි පැංචා

බලාගෙනයි හිටියේ,උකුස්සා මේ දෙන්නා ළඟට

වේගයෙන් එනවා ඉබි පැංචා දැක්කා.

‘‘යාලුවේ....අන්න උකුස්සෙක් මේ පැත්තට එනවා. දුවමු

...දුවමු....’’හා පැංචා කලබල වුනා. එයා ඒ මේ අත දිව්වා.



මේ සද්දේ ඇහිලා හා පැංචගෙ තාත්තා පැංචා ළඟට ආවා. උකුස්සා එයාගේ දිග නියපොතු වලින් හා පැංචගේ දිග කන් දෙක ඇල්ලුවා.හා පැංචව ඇඳගෙන උඩට යන්න හැදුවා.

ඉබි පැංචයි හා පැංචගේ තාත්තයි දෙන්නම උකුස්සගේ කකුල් දෙකේ එල්ලුනා. කලබල වුන උකුස්සා හා පැංචව අත ඇරලා ඈතට ඉගිලිලා ගියා.

හා පැංචා හයියෙන් අඬන්න පටන් ගත්තා.“ඉබි පැංචාගේ කැගැහිල්ල නිසා තමයි ඔයා බේරුනේ” හා පැංචාගේ තාත්තා කිව්වා.

“දැක්කද යාළුවේ ඔයාගේ ආඩම්බරකාර දිග කන් නිසා ඔයාව අහු වූනේ,කන් දිග වුනාට වැඩක් නෑ. හැමෝටම හොඳ යාළුවෙක් වෙන්න’’.හා පැංචාට හොඳටම ලැජ්ජ හිතුනා.හා පැංචා ඉබි පැංචාගෙන් සමාව ගත්තා.

“මට සමාවෙන්න යාළුවේ..තව පොඩ්ඩෙන් මගේ දිග කන් දෙක නිසා මාව අර උකුසුරාළට අහුවෙනවා”

තමන්ට තියෙන දේවල් ගැන ඕනෑවට වඩා ආඩම්බර වෙන්න හොඳ නැති බව හා පැංචා තේරුම් ගත්තා.එදා ඉඳන් හා පැංචා කැලේ හැමෝටම හොඳ යාළුවෙක් වුණා. සමඟියෙන් හිටියා. කාටවත් හිනා වුනේ නෑ .හා අම්මයි තාත්තයි කියන දේ හොඳට අහන හොඳ පැංචෙක් වුණා.

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්